# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1829/39 - 2013 සැප්තැම්බර් මස 27 වැනි සිකුරාදා - 2013.09.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රජයේ රේගු නිවේදනය

රේගු ආඥාපනතේ (235 අධිකාරය) 103 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, මෙම රෙගුලාසි පනවමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති,
(මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය).

2013 සැප්තැම්බර් මස 20 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

103 වැනි වගන්තිය

*රෙගුලාසි*

2007 ඔක්තෝබර් 26 වැනි දිනැති අංක 1520/17 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද රේගු ආඥාපනත ප්‍රකාර රෙගුලාසි පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

1. රෙගුලාසි අංක 01 පරිච්ඡින්න කර ඒ වෙනුවට පහත සඳහන් රෙගුලාසිය ආදේශ කරන ලදී :

   1. "මෙම රෙගුලාසි 2007 රේගු (අතිකාල, නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු සහ රේගු තොරතුරු හා තාක්ෂණ සන්නිවේදන අරමුදල) රෙගුලාසි යනුවෙන් හැඳින්වේ".

2. රෙගුලාසි අංක 02 පරිච්ඡින්න කර ඒ වෙනුවට පහත රෙගුලාසි ආදේශ කරන ලදී :

   2. රේගු ආඥාපනතේ අංක 103 වගන්තිය යටතේ පළකර ඇති රෙගුලාසිවල "අ" උපලේඛනයෙහි හෝ "ආ" උපලේඛනයෙහි හෝ "ඇ" උපලේඛනයෙහි හෝ "ඈ" උපලේඛනයෙහි හෝ "ඉ" උපලේඛනයෙහි හෝ "ඊ" උපලේඛනයෙහි හෝ "උ" උපලේඛනයෙහි හෝ "ඌ" උපලේඛනයෙහි හෝ "එ" උපලේඛනයෙහි දක්වා ඇති ප්‍රකාර රේගුවේ නිලධාරීන් සඳහා නියම කර ඇති සාමාන්‍ය රාජකාරි වේලාවලින් පිටස්තර වේලාවන්හි දී හෝ රාජකාරි සඳහා රේගුව වසා ඇති දිනවල එම නිලධාරීන් විසින් ඉටු කරනු ලබන සේවා සඳහා ගාස්තු හෝ අයකිරීම වශයෙන් අයකර ගනු ලබන සියලුම මුදල් සහ ඕනෑම රේගු නිලධාරියකු ස්වකීය නියම කාර්යාලයෙහි හෝ සේවා නියුක්ත ස්ථානයෙහි හෝ හැර වෙනත් කිසියම් කාර්යාලයක හෝ ස්ථානයක රාජකාරියෙහි නිරතවීම වෙනුවෙන් ගාස්තු හෝ අයකිරීම් වශයෙන් අයකරනු ලබන සියලු මුදල් සහ තාක්ෂණික විශේෂිත සේවා සැපයීම වෙනුවෙන් අයකරන සියලුම මුදල් පිළිවෙලින්, රේගු අතිකාල ගිණුම, රේගු නැව් බඩු පරීක්ෂණ



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ගාස්තු ගිණුම සහ රේගු තොරතුරු හා තාක්ෂණ සන්නිවේදන අරමුදල් ගිණුම යනුවෙන් හැඳින්වෙන වෙන් වෙන් වශයෙන් වන ගිණුම් තුන යටතේ, රේගු අතිකාල, නැව් බඩු පරීක්ෂණ ගාස්තු සහ රේගු තොරතුරු හා තාක්ෂණ සන්නිවේදන අරමුදල නම් වූ අරමුදලකට බැර කළ යුතුය.

මෙම නිවේදනයේ යම් වගන්තියක මීට පටහැනි විධිවිධාන සඳහන් වුවද, ගෙවිය යුතු අතිකාල දීමනා ගණනය කිරීමේ පහසුව තකා සහ අයදුම්කරුගේ පහසුව තකා ඉහත "අ" උපලේඛනයේ I ඡේදයේ සඳහන් සේවා වෙනුවෙන් ඉල්ලුම්කරුගෙන් එම කාර්ය ඉටුකරන ලද්දේ කවර වේලාවකදී ද යන කරුණු නොතකමින්, ඉහත සඳහන් බහාලූ සංඛ්‍යාව, නැව් බඩු තොග (වියලි/ද්‍රව) ප්‍රමාණය, වාහන සංඛ්‍යාව, යාත්‍රා සංඛ්‍යාව යනාදි සාධක පදනම් කරගනිමින් එම අදාල ගෙවීම භාර ගැනීමට රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට හැකිය. තව ද මෙම මුදල භාරගත යුත්තේ, අදාළ මෙහෙයුම් කාර්ය ඉටු කරන ලද්දේ කාර්යාල වේලාවෙන් පසුව හෝ රේගුව රාජකාරි සඳහා වසා ඇති දිනවල දී ඉටුකරන ලද්දක් පරිදි සළකමිනි.

3. 5 වැනි රෙගුලාසියෙන් පසු පහත සඳහන් රෙගුලාසිය එකතු කරන ලදී :
5 (අ) රේගු තොරතුරු හා තාක්ෂණ සන්නිවේදන අරමුදලේ මුදල් පහත සඳහන් ආකාරයට පරිහරණය කල හැකිය.

මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් අනුමත කරන ලද ක්‍රියාපටිපාටියකට යටත්ව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ හෝ වෙනත් රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතනයකට සපයනු ලබන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අදාළ විශේෂිත සේවාවන් වෙනුවෙන් රේගුවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ නිලධාරීන්ට ගෙවීම් කිරීම සඳහා මෙම මුදල් පරිහරණය කිරීමට රේගු අධ්‍යක්ෂ ජනරාල්ට හැක.

4. අංක. 1520/17 සහ 2007.10.26 දිනැති *ගැසට් නිවේදනයේ* සඳහන් පරිදි රේගු ආඥාපනතේ 103 A (2) වගන්තිය යටතේ සඳහන් කර ඇති H උපලේඛනයේ දෙවන ඡේදය අවලංගු කරමින් පහත රෙගුලාසි ඇතුළත් කරනු ලැබේ.

(2) (i) මගීන්ගේ ගමන් බඩු හැර අපනයන භාණ්ඩ පරීක්ෂා කිරීම හා නැව්ගත කිරීමට අනුමැතිය ලබා දීම.

| | |
|---|---|
| (අ) බහාලුමේ ප්‍රමාණය සැලකිල්ලට නොගෙන සම්පූර්ණ බහාලුමක් (FCL) සඳහා | රු. 550/- බැගින් එක් බහාලුමක් සඳහා |

(ii) මගීන්ගේ ගමන් බඩු හැර අපනයන භාණ්ඩ පරීක්ෂා කිරීම හා නැව්ගත කිරීමට අනුමැතිය ලබාදීම අර්ධ බහාලුම් (LCL) හා බහාලුම් ගත නොකළ තොග බඩු (Bulk Cargo).

| | |
|---|---|
| (අ) අර්ධ බහාලුම් (LCL) හෝ ඕනෑම ආකාරයක තොග බඩු (Blulk Cargo) සඳහා, එකී භාණ්ඩ තොගයේ (ප්‍රේෂණයේ) වටිනාකම රු.10,000/- අඩු වූ විට | ගාස්තු වලින් නිදහස් වේ. |
| (ආ) අර්ධ බහාලුම් (LCL) සඳහා, එකී භාණ්ඩ තොගයේ (ප්‍රේෂණයේ) වටිනාකම රු.10,000/- ඉක්මවූ විට | රු. 300/- බැගින් එක් සටහන්කරයකට |
| (ඇ) ඕනෑම ආකාරයක බහාලුම්ගත නොකරන ලද තොග බඩු (Blulk Cargo) සඳහා, එකී භාණ්ඩ තොගයේ (ප්‍රේෂණයේ) වටිනාකම රු.10,000/- ඉක්මවූ විට | මෙට්‍රික් ටොන් 01 ට රු. 20/- බැගින් |

(iii) මගීන්ගේ ගමන් බඩු හැර ගුවන් නැව් බඩු පරීක්ෂා කිරීම හා නැව්ගත කිරීමට අනුමැතිය ලබාදීම.

| | |
|---|---|
| (අ) භාණ්ඩ තොගයේ (ප්‍රේෂණයේ) වටිනාකම රු. 10,000/- ට අඩු වූ විට | ගාස්තු වලින් නිදහස් වේ. |
| (ආ) භාණ්ඩ තොගයේ (ප්‍රේෂණයේ) වටිනාකම රු. 10,000/- ඉක්මවූ විට | රු. 300/- බැගින් එක් සටහන් + කරයකට |

5. "ඌ" උපලේඛනයේ එම රෙගුලාසි අගට පහත සඳහන් උපලේඛනය එකතු කරන ලදී.

*"එ" උපලේඛනය*

*රේගු තොරතුරු හා තාක්ෂණ සන්නිවේදන ගාස්තු*

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයට "ASYCUDA" වර්ල්ඩ් භාවිතා කරමින් තාක්ෂණ සහය සැපයීම වෙනුවෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙන් (එක් භාවිතාවකට) රුපියල් 8000/- බැගින් මාසික ගාස්තුවක් අයකළ යුතුය. යම් ලිත් මාසයකට අදාලව ඉහත කී ආකාරයෙන් ගණනය කරන ලද එකී මුදල ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙරාතුව රේගු අතිකාල, නැව් බඩු පරීක්ෂණ ගාස්තු සහ රේගු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අරමුදල වෙත ගෙවිය යුතුය.

10 - 521

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.